JMC vLearning
"your virtual learning partner"

LKAS:36 වත්කම් හානිකරණය

AAT අදියර III

FAR - මූල්‍ය වාර්තාකරණය

සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

FARPack11

1

Sandeepa Jayasekera - JMC

AAT තෙවෙනි අදියර මූල්‍ය වාර්තාකරණය

Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Reading for MBA (PIM-SJP).

1

LKAS 36 වත්කම් හානිකරණය
LKAS 36 Impairment

2

ප්‍රශ්න අංක 01

හානිකරණය පැහැදිලි කරන්න.

පිළිතුරු අංක 01

Sandeepa Jayasekera - JMC 3

3

JMC vLearning
"your virtual learning partner"

වත්කම් හානිකරණයක් කියන්නේ මොකක්ද?

වත්කම් වල අගය
අඩුවීමෙන් සිදුවන අලාභය

4

වත්කමක ධාරණ අගය කියන එක අපි දන්නවා

ධාරණ අගය කියන්නේ පොත් වල දැනට පෙන්වන ශුද්ධ අගය

පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය	XX
(-) මෙතෙක් අය කළ සමුච්චිත ක්ෂය	(X)
(-) මෙතෙක් අය කළ සමුච්චිත හානිකරණ අලාභ	(X)
ධාරණ අගය	XX

5

නැවත අයකරගත හැකි අගය

ඕනෑම වත්කමකට තියෙනවා නැවත අයකරගත හැකි අගයක්
ඒ කියන්නේ වත්කමට ගියපු වියදම නැවත අයකරගන්නා අගයක්!

භාවිතයට ගැනීමේ අගය → වැඩි අගය ← සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන වියදම් අඩු කළ පසු අගය

↓

නැවත අයකරගත හැකි අගය

6

ඇයි වැඩි අගය ගන්නේ?

7

භාවිතයට ගැනීමේ අගය කියන්නේ,

වත්කම තුලින් ජනනය වන අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය

8

භාවිතයට ගැනීමේ අගය ගණනය කරද්දි සලකා බලන්න ඕන කරුණු

වත්කම භාවිතා කිරීම නිසා ඇතිවන මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් ගන්න ඕනි

ඵලදායී ජීව කාලය අන්තිමට වත්කම ඉවත් කරද්දී එන මුදල් ප්‍රවාහය ගන්න ඕනි

අනාගත මුදල් ප්‍රවාහ පුරෝකතනය කරන කොට

- සාධාරණ සහ තහවුරු කළ හැකි උපකල්පන පාවිච්චි කරන්න ඕනි
- උපරිම වසර 5 ක් පමණ කාලයක් සළකා බලන්න ඕනි
- මේ කියන මුදල් ප්‍රවාහ අපි ගන්නේ නෑ
  - බදු
  - පොලී ගෙවීම්
  - බැඳී නොමැති ප්‍රතිව්‍යුහගත කිරීම්

වට්ටම් කිරීම සඳහා අවදානම ගලපන ලද බදු පෙර පොලී අනුපාතය භාවිතා කළ යුතුය.

9

සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන වියදම් අඩු කළ පසු අගය කියන්නේ

වත්කම වෙළඳපොළේ විකිණිය හැකි වටිනාකමින් (SLFRS 13) විකිණීමට යන වියදම් අඩු කළ පසු වටිනාකම

10

විකිණීම සඳහා යන වියදම් වලට ඇතුළත් වන දෑ

නීතිඥ ගාස්තු	මුද්දර ගාස්තු	වත්කම් ඉවත් කිරීමේ වියදම්	වත්කම් ඉවත් කරන තත්ත්වයට ගෙන ඒමට යන වියදම්

විකිණීම සඳහා යන වියදම් වලට ඇතුළත් නොවන දෑ

වත්කම් ඉවත් කිරීමෙන් පසු ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කරන වියදම්

11

සාමාන්‍යයෙන් නැවත අයකර ගත හැකි අගය ධාරණ අගයට වඩා වැඩි වුණාට, යම් යම් හේතු නිසා නැවත අයකර ගත හැකි අගය ධාරණ අගයට වඩා අඩු වෙන්න පුළුවන්

ඔය හේතු වලට අපි කියනවා හානිකරණ සංඥා කියලා ඒවා මෙහෙම වර්ග කරන්න පුළුවන්

- අභ්‍යන්තර සංඥා
- බාහිර සංඥා

12

අභ්‍යන්තර හානිකරණ සංඥා

- වත්කමට වන භෞතික හානිවීම්
- යල්පැනීම්
- භාවිත නොකරන අක්‍රීය වත්කම්
- ව්‍යාපාරික සැළසුම් වල වෙනසක් නිසා භාවිතය අඩුවීම්
- අපේක්ෂා කලාට වඩා කාර්යසාධන අඩුවීම්

13

බාහිර හානිකරණ සංඥා

- වෙළඳපොල වටිනාකම ප්‍රමාණාත්මකව පහළ යාම
- වෙළඳපොල පොලී අනුපාත ඉහළ යාම
- සාර්ව ආර්ථික පරිසර සාධකවල අහිතකර වෙනස්වීම්
    - ○ බදු පැනවීම්
    - ○ තාක්ෂණික යල්පැනීම්
    - ○ පාරිභෝගික රුචිය වෙනස්වීම
    - ○ අහිතකර ලෙස නීති වෙනස්වීම්
- කොටස් වල වෙළඳපොළ මිල, කොටස් වල ශුද්ධ වත්කම් වටිනාකමට වඩා අඩු වීම

14

ප්‍රශ්න අංක 02

පහත අයිතම අතුරින් හානිකරණ සංඥා නොවන්නේ කුමක්ද?

1. තාක්ෂණික දියුණුව වත්කම් අනාගත භාවිතය අඩුවීමක් සිදුවීම.
2. රජය විසින් කර්මාන්තයට ලබාදෙන බව සහනාධාර
3. පොලී අනුපාත ඉහළ යාම
4. ව්‍යාපාරයේ ශුද්ධ වත්කම වලට වඩා වෙළඳපොල ප්‍රාග්ධනීකරණය වැඩි වීම
5. ගංවතුර හේතුවෙන් තොග හානි වීම
6. මෝටර් රථය අනතුරට ලක් වීම
7. විදේශ විනිමය අනුපාත ක්ෂය වීම මත අපනයන ආයතනයකට වන බලපෑම
8. ආයතනයේ පරිපාලන කටයුතු මාර්ගතව සිදු කිරීමට කළමනාකාරීතවය තීරණය කිරීම

Sandeepa Jayasekera - JMC 15

15

හානිකරණ සංඥාවක් තියෙනවා නම් හානිකරණ පරීක්ෂාව කරන්න ඕනි
හානිකරණ පරීක්ෂාවකදී නැවත අයකර ගත හැකි අගය තක්සේරු කරනවා

නැවත අයකර ගත හැකි අගය > ධාරණ අගය = හානිකරණ අලාභයක් නැත

නැවත අයකර ගත හැකි අගය < ධාරණ අගය = හානිකරණ අලාභයක් ඇත

හානිකරණ අලාභය = ධාරණ අගය − නැවත අයකර ගත හැකි අගය

Sandeepa Jayasekera - JMC 16

16

පහත වත්කම් වලට හානිකරණ සංඥා තිබුණත් නැතත්, වාර්ෂිකව හානිකරණ පරීක්ෂාව කරන්න ඕනි

අවිනිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්	භාවිතයට සුදුසු තත්ත්වයට පැමිණ ඇති අස්පෘශ්‍ය වත්කම්	ව්‍යාපාර සංයෝජන තුලින් ඇතිවන කීර්තිනාමය

17

හානිකරණ අලාභ ගිණුම් තැබීම

වත්කමේ ප්‍රත්‍යාගණන සංචිත තිබේද?

- නැත
  - හානිකරණ අලාභ වියදම් හර
  - සමුච්චිත හානිකරණ අලාභ බැර
- ඔව්
  - සංචිතයේ ප්‍රමාණයට
    - ප්‍රත්‍යාගණන සංචිත හර
    - සමුච්චිත හානිකරණ අලාභ බැර
  - ඉතිරිය → හානිකරණ අලාභ වියදම් හර / සමුච්චිත හානිකරණ අලාභ බැර

18

ප්‍රශ්න අංක 03

සසිදු ව්‍යාපාරය පරිගණක පද්ධතියක් මිලදී ගන්නා ලදී. එම පරිගණක තාක්ෂණය පසුකාලීනව, වෙනස් විය වටිනාකම අඩු වීමේ අලාභය රුපියල් මිලියන 2 ක් විය. මෙම පරිගණක පද්ධතියේ රු මිලියන 1ක ප්‍රත්‍යාගණන ලාභයක් ඇත. මෙය ගිණුම් තබන්නේ කෙසේද?

පිළිතුරු 03

19

හානිකරණයට වූ වත්කමක පසුකාලීන ගිණුම්කරණය

හානිකරණ අලාභ අඩු කළ පසු අගය ඉතිරි ඵලදායී ජීව කාලය පුරා ක්ෂය කළ යුතුය.

20

ප්‍රශ්න අංක 04

හිරාන් සමාගම බිස්කට් නිෂ්පාදනය කරයි. එහි තරඟකරුවෙකු විසින් නව නිෂ්පාදනයක් වෙළඳපොලට හඳුන්වා දුන් අතර එමනිසා, හිරාන් බිස්කට් සඳහා ඇති ඉල්ලුම අඩු වී ඇත. එහි යන්ත්‍ර සූත්‍ර අක්‍රියව පවතී
මෙම යන්ත්‍ර සූත්‍රවල ධාරණ අගය රු. මිලියන 100 ක් වේ.
මෙහි සාධාරණ අගය අඩු කිරීම විකිණීමට යන වියදම් රු. මිලියන 90 ක් විය.
භාවිතයට ගැනීමේ අයිතිය රු. මිලියන 98 ක් විය

1. හානිකරණ අලාභයට ගණනය කරන්න
2. යන්ත්‍රයේ ඉතිරි ඵලදායී ජීව කාලය වසර 4ක් නම්, පසු වර්ෂයේ ක්ෂය ගණනය කරන්න

පිළිතුරු 04

පිළිතුරු 04

Sandeepa Jayasekera - JMC 23

23

ප්‍රශ්න අංක 05

කසුන් ව්‍යාපාරයේ ලොරි රථය අනතුරකට ලක් විය. එදිනට සාධාරණ අගය අඩු කිරීම විකිණීමට යන වියදම් රු. මිලියන 5 ක් විය.
එම ලොරිය තවදුරටත් අවුරුදු 3 ක් භාවිතා කළ හැකිය.

- පළමු වසර තුල රු. මිලියන 2 ක්
- දෙවන වසර තුල රු. මිලියන 3 ක්
- තෙවන වසර තුල රු. මිලියන 1 ක්

ලැබේ යැයි අපේක්ෂා කරයි. සුන්බුන් වටිනාකම රු. මිලියන 1 කි. වට්ටම් අනුපාතය 10% කි. වත්කමේ ධාරණ අගය රු. මිලියන 7 ක් නම්, හානිකරණ අලාභය ගණනය කරන්න.

Sandeepa Jayasekera - JMC 24

24

පිළිතුරු 05

Sandeepa Jayasekera - JMC 25

25

පිළිතුරු 05

Sandeepa Jayasekera - JMC 26

26

JMC vLearning "your virtual learning partner"

ප්‍රශ්න අංක 06

නිමල් ව්‍යාපාරය සතු බීම නිෂ්පාදන යන්ත්‍රයේ ධාරණ අගය රු. මිලියන 5 කි.
මෙහි ඵලදායී ජීව කාලය වර්ෂ 5 කි.
යන්ත්‍රය අපේක්ෂිත කාර්යසාධනය අඩු වී ඇති බැවින් හානිකරණය වී ඇතැයි තීරණය කරන ලදී.
වාර්ෂිකව ඒකක 100,000 ක් නිෂ්පාදනය කල හැකිය
ඒකක මිල රු. 150 ක් වන අතර, ඒකක පිරිවැය රු. 100 කි
වට්ටම් අනුපාතය 10% කි.
නැවත අය කළ අගය ගණනය කරන්න.
හානිකරණ අලාභයක් වේ නම් එය ගණනය කරන්න.

පිළිතුරු 06

පිළිතුරු 06

Sandeepa Jayasekera - JMC 29

29

මුදල් උත්පාදන ඒකක

හානිකරණ අලාභ පුළුවන් තරම් තනි තනි වත්කම් වලට වෙන වෙනම ගණනය කරන්න ඕනි.

තනි වත්කමක් අනිත් වත්කම් වලින් වෙන් කරලා හඳුනාගන්න අපහසු වුනොත් ඒ වත්කම ඇතුල් වෙලා තියෙන මුදල් උත්පාදන ඒකකයේ හානිකරන අලාභය බැලුවා නම් හරි

30

මොකද්ද මේ මුදල් උත්පාදන ඒකක කියන්නේ?

මුදල් උත්පාදන ඒකක කියන්නේ අනිකුත් වත්කම් වලින් ස්වාධීනව වෙන්කර හඳුනාගත හැකි, මුදල් උත්පාදනය කරන කුඩාම වත්කම් සමූහය.

- ආයතනයක දෙපාර්තමේන්තු
- පරිපාලිත සමාගම්
- අංශ

වගේ මුදල් උත්පාදන ඒකක වෙනවා

31

මුදල් උත්පාදන ඒකක උදාහරණ

- කෑම අලෙවිහලක ඇති මේස, පුටු ස්වාධීනව මුදල් උත්පාදනය කරන්නේ නැත. එමනිසා අලෙවිසැලේ ඇති සියළු වත්කම් මුදල් උත්පාදන ඒකකයක් ලෙස සැළකිය හැකිය

- පතලක් තුල ඇති ඛනිජ ගෙන යාමට නිර්මාණය කළ දුම්රිය සේවයක් වේ. එම දුම්රිය සේවය ස්වාධීනව ක්‍රියාත්මක වේ. එය මුදල් උත්පාදන ඒකකයක් ලෙස සැලකිය හැකිය.

32

මුදල් උත්පාදන ඒකකයේ හානිකරණ අලාභ

හානිකරණ අලාභය = මුදල් උත්පාදන ඒකකයේ ධාරණ අගය − මුදල් උත්පාදන ඒකකයේ නැවත අයකර ගත හැකි අගය

මුදල් උත්පාදන ඒකකයේ හානිකරණ අලාභ ගලපන ආකාරය

- නිශ්චිත වශයෙන් හානිකරණය වූ වත්කම් තිබේනම් එයට ගලපන්න.
- මුදල් උත්පාදන ඒකකයේ කීර්තිනාමයට ගලපන්න.
- ඉතිරි අලාභය, ඉතිරි වත්කම් අතර වත්කම් වටිනාකමට බර තැබූ අනුපාතයට ගලපන්න.

33

ප්‍රශ්න අංක 07

හරිනි සමාගමේ බදුල්ල ශාඛාව වෙනම මුදල් උත්පාදන ඒකකයක ලෙස සලකයි. එහි වත්කම් හි ධාරණ අගය පහත පරිදි වේ

වත්කම්	රු. මිලියන
ගොඩනැගිල්ල	10
යන්ත්‍ර සූත්‍ර	5
මෘදුකාග	2
කීර්තිනාමය	2
ධාරණ අගය	19

34

ප්‍රශ්න අංක 07

මෙම මුදල් උත්පාදන ඒකකය හානිකරණය වී ඇත.
මෙහි භාවිතයට ගැනීමේ අයිතිය රු. මිලියන 10 ක් විය.
සාධාරණ අගය අඩු කිරීම විකිණීමට යන වියදම රු. මිලියන 9 ක් විය.
මෙහි ඇති මෘදුකාංගය සම්පූර්ණයෙන්ම හානිකරණය වී ඇත.
හානිකරණ අලාභ වත්කම් වෙත ගැලපිය යුතු අයුරු අත්වන්න.

Sandeepa Jayasekera - JMC 35

35

පිළිතුරු 07

Sandeepa Jayasekera - JMC 36

36

පිළිතුරු 07

37

හානිකරණ අලාභ ප්‍රතිවර්ත කිරීම

හානිකරණය වූ වත්කමක නැවත අයකරගත හැකි අගය ධාරණ අගයට වඩා වැඩි වූ විට, පෙර අය කළ හානිකරණ අලාභය ප්‍රතිවර්ත කළ හැකිය.

හානිකරණ අලාභ වෙන්කිරීම හර
වෙනත් වියදම් ගිණුම බැර

ප්‍රතිවර්ත වන වත්කමේ වටිනාකම, හානිකරණ අලාභයට පෙර වත්කමේ ධාරණ අගය (ක්ෂය අඩු කළ පසු) ඉක්මවා යා නොහැකිය.

මුදල් උත්පාදන ඒකකයක හානිකරණයක් ප්‍රතිවර්ත වන විට, කීර්තිනාමය හැර සෙසු වත්කම මත හරිත සාමාන්‍ය පදනමින් ප්‍රතිවර්ත කළ යුතුය.

38

ප්‍රශ්න අංක 08

පැතුම් සමාගමේ යන්ත්‍රයේ ධාරණ අගය රු. මිලියන 10 ක් විය.
එහි ඉතිරි ඵලදායී ජීව කාලය වසර 5 කි.
එහි නැවත අයකරගත හැකි අගය රු. මිලියන 10 ක් දක්වා වැඩි විය.

1. හානිකරණ අලාභය සහ ද්විත්ව සටහන දක්වන්න.
2. හානිකරණ අලාභය ප්‍රතිවර්ත වීම ගණනය කිරීම් සහිතව දක්වන්න.

පිළිතුරු 08